**වවුනියාව නගර සභාව**
**වවුනියා දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**---------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත්කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තයව 2018 අගෝස්තු 22 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට වවුනියාව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශය පිළිබඳ අදහස් දැක්වීම
**----------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**-----------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ළමා උද්‍යානයක් බාහිර ආයතනයකට බදුදීම වෙනුවෙන් ලැබිය යුතු හිඟ බදු කුලි ආදායම් එකතුව රු. 125,000 ක මුදල පසුගිය වර්ෂ 5 ක් තුල මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදල අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) යුරෝපා සංගමයේ ආධාර යටතේ වවුනියාව වැව් ප්‍රදේශයේ දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන යටතේ රුපියල් මිලියන 40 ක වියදමින් ඉදිකර 2017 මැයි 17 දින සභාව වෙත පවරන ලද අපජල පිරිසිදු කිරීමේ පද්ධතියේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගෙනවිත් නොතිබීමෙන් වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

#### 1.3.2 ලැබියයුතු සහ ගෙවියයුතු ගිණුම්
**-------------------------------------**

**(අ) ලැබියයුතු ගිණුම්**
**-------------------**

පහත කරුණු නිරීක්ණය විය.

(i) සභාවේ සේවය කර ස්ථාන මාරුවී ගොස් ඇති නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවියයුතු හිඟ සේවක ණය ශේෂයේ එකතුව රු. 489,980 ක මුදල පසුගිය වර්ෂ 01 සිට වර්ෂ 02 තුල අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ii) සභාව විසින් සේවයෙන් පහකරන ලද නිලධාරියෙකුගෙන් අයවිය යුතු හිඟ සේවක ණය ශේෂය රු. 28,795 කි. එම මුදල පසුගිය වර්ෂ 03 ක් තුල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) ගෙවියයුතු ගිණුම්**

**--------------------**

එකතු රු. 10,139,375 ක්වූ ගෙවියයුතු ශේෂ 05 ක් ගෙවීමට කටයුතු නොකර වර්ෂ 01 සිට වර්ෂ 04 ක මූලා‍ය ප්‍රකාශවල දක්වා තිබුණි.

**1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**------------------------------------------------------------**

**විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම**

**------------------------------------------------------------**

භෞතික වත්කම් සහ තාක්ෂණ වාර්තා ඉදිරිපත් නොකිරීමෙන් එකතු රු. මිලියන 232.06 ක ගනුදෙනු එකොළහක් විගණයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂය කිරීම නොහැකි විය.

**1.3.4 අනුකූල නොවීම**

**-------------------**

**නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**--------------------------------------------------------------------------------**

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| | රු. | |
| (අ) නගර සභා ආඥා පනත | | |
| (i) වගන්ති 44(2) | - | නගර සභාවන් පිහිටුවා වර්ෂ 3 ක් ඇතුලත සභාවේ මං මාවත පිළිබඳ ලැයිස්තුවක් රජයේ ගැසට් පත්‍රයේ පළකර නොතිබුණි. |
| (ii) පරිච්ඡේදය III වගන්තිය 54(1) | - | වරිපනම් බදු සම්බන්ධ ලැයිස්තුව නොවැම්බර් 15 දිනට ප්‍රථම ලේකම්ට භාරදී දෙසැම්බර් 15 දිනට ප්‍රථම අයකරීම් නිමකර නොතිබුණි. |
| (iii) පරිච්ඡේදය III වගන්තිය 54(2) | - | වරිපනම් බදු අයකිරීම අදාල කාල පරිච්ඡේදයතුල සිදුකර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| (i) මුදල් රෙගුලාසි 316(2) | - | දෛනික මුදල් ශේෂ සහ සේප්පුවේ තබන භාණ්ඩ සම්බන්ධයෙන් ලේඛණයක් පවත්වා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571(2) හා (3) | 740,043 | කල් ඉකුත්වූ තැන්පත් 10 ක් සම්බන්ධයෙන් පසුගිය වසර දෙකක කාලයතුල අවශ්‍ය කටයුතු කර නොතිබුණි. |
| (ඇ) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරණ චක්‍රලේඛය | | සභාවේ වාහන 58 ක ඉන්ධන පාරිභෝජන පිළිබඳ පරික්ෂණ වර්ෂයක් ඇතුලත පවත්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඈ) 1982 අංක 04 දරණ නාගරික සංවර්ධන අධිකාරිය පනත | - | නගර සභා බල ප්‍රදේශයේ පවත්වන ලද භෞතික පරීක්ෂණයේදී ස්ථාන 14 කදී හඳුනා ගන්නා ලද අනවසර ඉදිකිරීම් 78 ක් සම්බන්ධයෙන් ඒවා ඉවත් කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. |
| (ඉ) නාගරික සංවර්ධන අධිකාරියේ චක්‍රලේඛ 1985 මාර්තු 20 දිනැති ටීජ්සී/01 අංක සහ 2008 අගෝස්තු 11 අංක 21 | | නාගරික සංවර්ධන රැස්වීම්වල සහභාගිවීම වෙනුවෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට චක්‍රලේඛයට පටහැනිව රු. 31,000 ක් ගෙවා තිබුණි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 37,569,664 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 28,523,811 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 23,262,046 | 29,895,123 | 26,189,258 | 42,649,494 | 23,162,046 | 18,964,090 | 25,983,539 | 46,355,358 |
| (ii) | කුලී | 34,141,469 | 36,494,175 | 37,091,229 | 5,434,906 | 33,431,949 | 39,990,685 | 42,185,808 | 4,837,853 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,515,000 | 1,946,555 | 1,946,555 | - | 2,263,500 | 1,998,937 | 1,998,937 | - |
| (iv) | වෙනත් ආදායම් | 128,804,000 | 110,948,701 | 126,874,659 | 28,191,591 | 128,871,003 | 98,151,117 | 115,441,740 | 22,557,730 |

#### 2.2.2 වරිපනම් බදු

හිඟ වරිපනම් බදු සහ විනෝද බදු ශේෂවල එකතුව රු. මිලියන 42.5 ක් අයකර ගැනීම සඳහා පසුගිය වර්ෂ 01 සිට 05 දක්වා සභාව විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

**2.2.3 කුලි**

**----**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රු. 5,434,907 ක අයවැයයුතු කුලි සම්බන්ධයෙන් වර්ෂ 01 සිට වර්ෂ 05 දක්වා අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව අයත් කඩ කාමර 58 ක් බදු දී තිබුණද, වර්ෂ 01 සිට වර්ෂ 47 දක්වා එම කඩ කාමර සඳහා බදු ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(ඇ) සභාව සතු බදු දී තිබු කඩවල් 315 ක් සහ ඉඩම් බදු දී තිබු බදු ගිවිසුම් කාලය අවසන් වී වර්ෂ 01 සිට වර්ෂ 33 ක් ගතවී තිබුණද, ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව සතු කඩ කාමර 118 ක් වර්ෂ කීපයකට පෙර බදු දී තිබුණි. එම කඩවලින් 77 ක් සභාවේ අනුමැතියෙන් තොරව බදු කරුවන් වෙනත් පාර්ෂවයන්ට විකුණා තිබුබව විගණනයේදී නිරීක්ෂණය විය.

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**------------------------------**

උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු යුතුව තිබූ උසාවි දඩ රු. 12,064,491 ක් සහ මුද්දර ගාස්තු රු. 16,127,100 ක් විය.

**2.2.5 වැඩිපුර ගෙවීම**

**-----------------**

මාර්ග සහ ගොඩනැගිලි 11 ක් ප්‍රතිසංස්කරනය කිරීමේ කොන්ත්‍රාත් වලදී සමාලෝචිත වර්ෂයේදී කොන්ත්‍රාත්කරුවෙකුට රු. 1,149,955 ක මුදලක් සහා අරමුදලින් වැඩිපුර ගෙවා තිබුණි.

**3 මෙහෙයුම් සමාලෝචිතය**

**---------------------------**

**3.1 කාර්‍ය සාධනය**

**-----------------**

**ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

**----------------------------------**

(i) ඝණ අපද්‍රව්‍ය වර්ගී කරනයකින් තොරව එකට ගොඩ ගසා තිබුණි.

(ii) ඝණ අපද්‍රව්‍ය සඳහා කොම්පෝස්ට් සහ ප්‍රතිචක්‍රීයකරනය ක්‍රමය ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii)

**3.2 හඳුනාගත් පාඩු**

**-----------------**

පාඨකයින් විසින් පිටතට ගෙන ගොස් ඇති වටිනා පුස්තකාල පොත් 105 ක් වර්ෂ 8 කට වඩා වැඩි කාලයක් ආපසු ලබා නොගැනීමට කටයුතු නොකිරීමෙන් සභාවට පාඩු සිදුවී ඇතිබව නිරීක්ෂණය විය.

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතාව**

**------------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඝණ අපද්‍රව්‍යයන් පොහොර නිෂ්පාදනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 1,079,891 ක් වැය කර තිබුණද, පොහොර විකිණීමෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 147,210 ක් පමණක් ලැබී තිබුණි. මෙය සමාලෝචිත වර්ෂයේ පොහොර නිෂ්පාදන වියදමෙන් සියයට 14 කි.

(ආ) සභා පුස්තකාලයේ උපදේශන අංශයේ වටිනා පොත් 10 ක් නිලධාරින් 10 දෙනෙකුට ලබාදී තිබුණද, වර්ෂයට වඩා වැඩි කාලයක සිට ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව විසින් ගොඩනැගිලි බලපත්‍ර ලබාදී තිබූ 160 දෙනෙකුට අනුකූලතා සහතික ලබාදීමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි.

(ඈ) නගර සභා බලප්‍රදේශයේ ඉදිකර තිබූ සන්නිවේදන ආයතන 04 ක් විසින් සවිකර තිබූ සන්නිවේදන කුළුණුවල ප්‍රමාණය සහ උස අනුව වටිනාකම තීරණය කර ගිවිසුම් ගතවී වටිනාකම අයකර ගැනීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි.

## 3.4 මානව සම්පත් කළමනාකරණය

2017 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලය සංඛ්‍යාව සහ තථ්‍ය කාර්ය මණ්ඩල සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ග | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ට මට්ටම | 03 | 01 | 02 |
| ද්විතීය මට්ටම | 51 | 43 | 08 |
| ප්‍රාථමික මට්ටම | 129 | 110 | 19 |
| | 183 | 154 | 29 |

## 3.5 නිෂ්කාර්ය තැන්පත්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වවුනියා පැරණි පස් නැවතුම් පොළේ බිත්තිය සහ ගොඩනැගිලි වල බිත්තිවල සායම් ගෑම සඳහා රාජ්‍ය නොවන ආයතනයන් සභාව වෙත ලබාදී තිබූ රු. 500,000 ක මුදල අදාල කටයුතු සඳහා යෙදවීමට ක්‍රියා නොකර වර්ෂයකට වඩා වැඩි කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ආ) රු. 745,225 ක පුස්තකාල ගොඩනැගිලි අරමුදල වර්ෂ 4 කට වැඩි කාලයක් අදාල කටයුතු සඳහා යොදාගැනීමකින් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී නිමකරනු ලැබූ කර්මාන්ත 6 ක වැඩ සඳහා රු. 12,480,360 ක් සහා අරමුදල් උපයෝගී කරගෙන ගෙවා තිබුණි. කෙසේ වුවද, නිසි පරිදි පොලවේ තණ පිඩැලි ඇල්ලීම කර නොතිබීම, මාගී ඉවුරු දෙකේ ගල් නිසි පරිදි සකස්කර නොතිබීම, පාර දෙපැත්තක නිසි පරිදි සකසා නොතිබීම, මාගී ඉරිතැලි තිබීම, අනුමත පස් වර්ගය වෙනුවට බොරළු පස් යොදා තිබීම යන අඩුපාඩු නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මරක්කාරම්පල ඇතුලත පළමු මාගීයේ බෝක්කුවක් ඉදිකිරීම සඳහා සභා අරමුදලෙන් රු. 107,957 ක් කොන්ත්‍රාත් කරුවෙකු වෙත ගෙවා තිබුණද භෞතිකව සත්‍යාක්ෂණය කර නොතිබුණි.

## 3.7 වත්කම් කළමනාකරණය

### 3.7.1 නිෂ්ක්‍රිය සහ ඌණ උපයෝජිත වත්කම්

සභා ගබඩාවේ රු. 1,915,830 ක් වටිනා භාණ්ඩ, වර්ෂ 02 කට වඩා වැඩි කාලයක් නිෂ්කාර්යව තිබුණි.

### 3.7.2 නඩත්තු හා අළුත්වැඩියා කිරීමට කටයුතු නොකිරීම

සභාවට අයත් වාහන 13 ක් වර්ෂ දෙකකට වඩා වැඩි කාලයක් නඩත්තු නොකර තිබූ බව විගණනයේදී අනාවරණය විය.

### 3.7.3 පවරා නොගත් වත්කම්

පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ වාහන 18 ක් සභාවට පවරාගෙන නොතිබුණි.

## 4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

අයවැය ගත ආදායම් සහ තථ්‍ය ආදායම් අතර අහිතකර විචලනය රු. 568,445 සිට හිතකර විචලන රු. 12,485,782 දක්වා නොහොත් සියට 22.60 සිට සියට 51.10 දක්වා විචලනයද, ඇස්තමේන්තු ගත වියදම් සහ තථ්‍ය වියදම් අතර අහිතකර රු. 2,768,630 සිට හිතකර රු. 13,265,166 දක්වා නොහොත් සියට 33.39 සිට සියට 15.47 දක්වා විචලනයක් නිරීක්ෂණය විය.

## 5 පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩු |
| --- | --- |
| (අ) ස්ථාවර වත්කම් | (i) ලේඛන ගත නොකිරීම.<br>(ii) ආරක්ෂාව තහවුරු කර නොතිබීම. |
| (ආ) තොග | අනිසි තොග පාලනය. |
| (ඇ) සේවක මණ්ඩලය කළමනාකරණය | පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම. |
| (ඈ) කොන්ත්‍රාත් | තාක්ෂණ නිලධාරින්ගේ අධීකරණ ප්‍රමාණවත් නොවීම. |